# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/4 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් 19 වැනි දින,
නුවරඑළියේ දී ය.

### නියෝගය

1. (1) රජයේ සංස්ථාවක යම් සේවකයකු—

(අ) ශ්‍රී ලංකාවේ නීත්‍යනුකූලව පිහිටුවනු ලැබූ ආණ්ඩුවට සම්බන්ධ කරුණුවලට හානිකර වූ, හෝ එහි ආරක්ෂාවට අන්තරාදයක වූ යම් කටයුත්තක නිරතව සිටින බවට ; හෝ

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ තහනම් කරන ලද යම් සංවිධානයක කටයුතුවලට හවුල් වී හෝ සම්බන්ධ වී ඇති බවට ; හෝ

(ඇ) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ ඒ යටතේ පනවන ලද යම් ආඥාවක් හෝ රීතියක් පිළිපැදීම කඩ කර ඇති හෝ පැහැර හැර ඇති බවට ;

සැක කරනු ලබතහොත් ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඒ සංස්ථාවේ කළමනාකාරිත්වය භාර කරනු ලැබ සිටින තැනැත්තා විසින් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ තැනැත්තාගේ පරම අභිමතය අනුව ඒ සේවකයාගේ සේවය අත්හිටුවිය හැකි ය.

(2) රජයේ සංස්ථාවක සේවකයකුගේ සේවය (1) වැනි ඡේදය යටතේ අත්හිටුවා ඇති අවස්ථාවක, එසේ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබ තිබූ කාලය තුළ දී යම් වැටුපක් හෝ දීමනාවක් ගෙවනු ලැබීමට ඔහුට හිමිකම් නො තිබිය යුතු ය :

එසේ වුව ද, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ සංස්ථාවේ කළමනාකාරිත්වය භාර කරනු ලැබ සිටින තැනැත්තා හෝ විසින්, එම අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ තැනැත්තාගේ පරම අභිමතය අනුව, එකී සේවකයකු සාමාන්‍යයෙන් හිමිකම් ලබා ඇති වැටුපෙන් හරි අඩක් දීමනා සහිතව හෝ රහිතව ඔහුට ගෙවිය හැකි ය.

(3) මෙම නියෝගය යටතේ රජයේ සංස්ථාවක සේවකයකුගේ සේවය අත්හිටුවීම හෝ එවැනි සේවකයකුට වැටුප් හෝ දීමනා කිසිවක් නොගෙවීම යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියෙහි ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) අන් කිසි නීතියක හෝ රජයේ සංස්ථාවක සේවකයින් සහ ඒ රජයේ සංස්ථාව ද අතර ඇති කරගෙන ඇති යම් සේවා ගිවිසුමක කොන්දේසි සහ නියමයන්හි කුමක් සඳහන්ව ඇත ද මේ නියෝගයෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය.

(5) මෙම නියෝගයෙහි " රජයේ සංස්ථාවක් " යන්නෙන් ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් ආණ්ඩුව විසින් සපයනු ලැබූ සංස්ථාවක් අදහස් වේ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

29A—ඒ 13568—2,100 (75/04)